00337

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - **VI** වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - **2023/2024**

වාණිජ නීතිය - **LLU6716**

කාලය : පැය එකයි **(01)** යි

---

දිනය: **2025. 01.11** | වේලාව : ප.ව.**01.30** - ප.ව.**02.30**

---

මුළු ප්‍රශ්න ගණන - දෙකයි 02

ප්‍රශ්න <u>එකකට (01)</u> පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. රමේෂ් මුහුදු ආහාර සැපයුම්කරුවෙකු වන අතර, ඔහු නිමල් සමඟ ගිවිසුමකට එළැඹියේ ඔහුගේ කොළඹ ප්‍රදේශයේ පිහිටි අවන්හලේ භාවිතය සඳහා ඉස්සන් කිලෝග්‍රෑම් 80ක ප්‍රමාණයක් විකිණීමටය. එම එකගතාවයේ සඳහන් වන පරිදි, රමේෂ් තම සැකසුම් මධ්‍යස්ථානයේ සිට නිමල්ගේ අවන්හලට භාණ්ඩ ප්‍රවාහණය කිරීමේ වගකීම දරයි. රමේෂ්ගේ සැකසුම් මධ්‍යස්ථානයේ සිට නිමල්ගේ අවන්හලට ලඟාවීම සඳහා ගොඩබිම් මාර්ගයෙන් පැය පහක් ගතවේ. මෙම ප්‍රවාහණය අරමුණු කර ගනිමින් රමේෂ් කුමාර්ගේ විවෘත ට්‍රක් රථය කුලියට ගත්තේ ය. රමේෂ් උදේ 7.00 ට බෙදා හැරීමේ ගමන ආරම්භ කළ අතර නිමල්ගේ අවන්හලට අදාළ දිනයේ ම දහවල් 12.30 පමණ වන විට භාණ්ඩ භාර දුන්නේ ය.
   භාණ්ඩ බෑමේ දී ඔහු විසින් අනාවරණය කරගනු ලැබුවේ භාරදෙන ලද භාණ්ඩවලින් කිලෝග්‍රෑම් 65 ක් ඉස්සන් වන බවත් ඉතිරි කිලෝග්‍රෑම් 15 දැල්ලන් වන බවත් ය. තවද ඉස්සන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පරිභෝජනයට නුසුදුසු වන පරිදි නරක් වී ඇති බවත් සොයා ගන්නා ලදී.
   භාණ්ඩ භාරදීමේ සහ භාරගැනීමේ රීතින්වලට අදාළව ඉහත සිදුවීමය කරුණුවලින් පැන නගින නීතිමය ගැටලු විශ්ලේෂණය කරන්න.
   අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

**(ලකුණු 20)**

2. "ණය ගනුදෙනුවලදී පාරිභෝගිකයන්ගේ යහපත සහ සාධාරණත්වය ස්ථාපිත කිරීම සඳහා කුලී සින්නක්කර ගිවිසුමක කුලීකරුගේ අයිතිවාසිකම් සහ වගකීම් ඉතා වැදගත් වේ."
   1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.
   ඔබගේ පිළිතුර නඩු තීන්දු ඇසුරෙන් සනාථ කරන්න.

**(ලකුණු 20)**

****සියළුම හිමිකම් ඇවිරිණි****